**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.01.23 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ඇල්ල ඔඩිසි දුම්රියේ සිදුවන ඊ ටිකට්පත් වංචාවට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව**

ඇල්ල ඔඩිසි දුම්රියේ සිදුවන ඊටිකට්පත් වංචාව සම්බන්ධයෙන් ලද පැමිණිල්ලකට අනුව අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් මේ වන විට විමශර්න ආරම්භ කර ඇත. ඒ අනුව 2025.01.22 වන දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේ දුම්රිය දෙපාතර්මේන්තුවේ සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීවරයෙකු ඊ ටිකට්පත් 92 ක් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි. එම සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙම ටිකට්පත් විදේශීය සංචාරකයින්ට සහ අනෙකුත් සංචාරකයින්යට වැඩි මුදලට අලෙවි කිරීම සඳහා ළඟ තබා ගෙන සිටි බවට කරුණු අනාවරණය වී ඇත.

එමෙන්ම මෙම සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවෙකු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් මාතලේ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර මහනුවර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය විසින්ද ලද තොරතුරක් මත ඊ -ටිකට්පත් 29 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු මුදල් රුපියල් 131,000/- ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

එම සැකකරුද වැඩිදුර විමශර්න සඳහා අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වෙත භාර දීමට කටයුතු කර ඇත. මෙම ඊ ටිකට්පත් මොවුන්ට ලබා දුන් පාශර්වයන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් තවදුරටත් විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**